ඉඩමේ නම: පතෝලවත්ත හෙවත් පතවලවත්ත; ඉඩමේ විස්තර: අවුරුදු 30 කට අධික පොල්වැවිල්ලකින් හා කුරුඳු වැවිල්ලකින් යුක්ත ය, අවුරුදු 30 කට අධික පොල් ගස් 332 ක් ද, අවුරුදු 5 කට අධීක පොල් ගස් 51 ක් ද, අවුරුදු 30 කට අධික කොස් ගස් 6 ක් ද, අවුරුදු 30 කට අධික ගොරක ගස් 2 ක් ද, අවුරුදු 15 ක් වූ බිලින් ගසක් හා අවුරුදු 5 ක් වූ කජුගස් 5 ක් ද තිබේ; ප්‍රමාණය: අ. 4, රූ. 2, ප. 33.7 කි; හිමිකම් කියන අය: ඇස්. එච්. හේමවතී ද සිල්වා මහත්මිය, අංක 273, ත්‍රිකුණාමල විදිය, මාතලේ.

**ප්‍රමාණය මුළු එකතුව: අ. 15, රූ. 3, ප. 01.1 කි.**

අත්කර ගෙන ඇති ඉඩම් වලට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1962 මැයි මස 14 දින උදේ 9 ට මාතර කච්චේරියේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම් පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1962 මැයි මස 7 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් ඔවුන් හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලියවිල්ලකින් බලය ලත් නියෝජිතයින් හෝ මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

මේ සම්බන්ධ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියළු ඔප්පු තිරප්පු හා අනිකුත් ලියවිලි පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු සි.

ප්‍රා. සී. පීටර්ස්,
රජයට ඉඩම් අත්කර ගැනීමේ නිළධාරි, මාතර.

1962 මාර්තු මස 29 වැනි දින,
මාතර කච්චේරියේ දීය.

4-131

## 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

සඳහන් අංකය: එල්බී/2484/ජේ60/61/එල්/252 (වීජී.)

මහාජන කායඹයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම් ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩම්වල විස්තර:—

අංක ඒ 1,922 මූලික සැළැස්මේ අංක 1, 2 සහ 3 දරණ ඉඩම් කැබැලි.

මෙම ඉඩම් මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිළධාරි කොටසේ, පැලැන ගම්මුලාදැනි වසමේ, පැලැන ගමේ පිහිටා තිබේ.

**කැබැලි අංක 1.**

ඉඩමේ නම: වදනවත්ත සහ පොකුනෙවත්ත; ඉඩමේ විස්තර: අවුරුදු 30 කට අධික පොල්, දෙල් හා වෙනත් මිශ්‍ර වැවිලි සහිත ඉඩමකි, එහි කටුමැටිගසා අතු සෙවිලිකොට තණන ලද තාවකාලික ගෙවල් 15 ක් ද, පොල් අතු සෙවිලි කරන ලද ගෙවල් 11 ක් ද, තාවකාලික මඩු 21 ක් ද, තාවකාලික ළිං 7 ක් තිබේ; ප්‍රමාණය: අ. 5, රූ. 2, ප. 16.7; හිමිකම් කියන්නෝ: ඒ. ඇන්. ද ඩොමිනිකො, කෝරලේ වලව්ව, මාතර, ඇල්. සී. එච්. හාර්ට් මහත්මිය, කොටුව, මාතර.

**කැබැලි අංක 2.**

ඉඩමේ නම: වදනවත්ත; ඉඩමේ විස්තර: අවුරුදු 30 කට අධික පොල් වැවිල්ල සහිත ඉඩමකි; ප්‍රමාණය: අ. 1, රූ. 3, ප. 12 කි; හිමිකම් කියන්නෝ: ඒ. ඇන්. ද ඩොමිනිකො, කෝරලේ වලව්ව, මාතර, ඇස්. සී. හාර්ට් මහත්මිය, කොටුව, මාතර.

**කැබැලි අංක 3.**

ඉඩමේ නම: වදනවත්ත; ඉඩමේ විස්තර: අවුරුදු 30 කට අධික පොල් වැවිල්ලක් හා මුඩු බිමක් ද සහිත ඉඩම; ප්‍රමාණය: අ. 4, රූ. 0, ප. 30.1; හිමිකම් කියන්නෝ: ඒ. ඇන්. ද ඩොමිනිකෝ, කෝරලේ වලව්ව, මාතර, එල්. සී. එච්. හාර්ට් මහත්මිය, කොටුව, මාතර.

**ප්‍රමාණය මුළු එකතුව: අ. 11, රූ. 2, ප. 18.8 කි.**

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩම්වලට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1962 මැයි මස 14 දින සවස 3.30 ට මාතර කච්චේරියේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම් පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1962 මැයි මස 7 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් ඔවුන් හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලියවිල්ලකින් බලය ලත් නියෝජිතයෝ හෝ මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

මේ සම්බන්ධයෙන් අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියළු ඔප්පු තිරප්පු හා අනිකුත් ලියවිලි පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු සි.

ප්‍රා. සී. පීටර්ස්,
රජයට ඉඩම් අත්කර ගැනීමේ නිළධාරී, මාතර.

1962 මාර්තු මස 29 වැනි දින,
මාතර කච්චේරියේ දීය.

4-132

---

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පණතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

සඳහන් අංකය: එල්.බී. 2496—ජේ.60/61එල්.ජී. 338.

මහාජන කායඹයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කරගෙන තිබෙන බව 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පණතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කරගෙන තිබෙන ඉඩමේ විස්තර:—

අංක ඒ 1,946 දරණ මූලික සිතියම.

**කැබැලි අංකය: 1.**

ඉඩමේ නම: අද්දර කුඹුර; ඉඩමේ විස්තර: පාළු කුඹුර; හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපින: මාතර, වල්ගම, ඩබ්ලිව්. ඒ. කේ. අනගිහෝනා යසවතී කුමරප්පෙරුම සහ පද්මිනි කුමරප්පෙරුම සහ මාතර, පඹුරන, මේබල් කුමරප්පෙරුම; බිම් ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 19.0.

අත් කරගෙන තිබෙන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1962 මැයි මස 16 වෙනි දින පෙරවරු 10ට මාතර කච්චේරියේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1962 මැයි 7 වෙනි දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දන්වීමකින් ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ඉහත කී ලෙස බලය ලත් අය හෝ මට ලියා දන්විය යුතුයයි ද නියම කරමි.

තවද තමන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීමට අවශ්‍ය ඔප්පු හා අනෙක් ලියවිලි පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි.

ප්‍රා. සී. පීටර්ස්,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

මාතර කච්චේරිය,
1962 මාර්තු මස 29 වෙනි දය.

4-122

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපණතෙන් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

මගේ අංකය: එල්ඒ/එෆ්/7692.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:—

පහත සඳහන් ඉඩම පිහිටා ඇත්තේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ නැගෙනගිර ගිරුවා පත්තුව ආදායම් නිලධාරි කොටසේ, හාතගල නම් ගමේය.

සැලැස්ම විස්තර: අංක 469 දරණ අවසාන ගම් සැලැස්මේ අංක 1 දරණ අතිරේකය

**කැබලි අංකය : 21.**

ඉඩමේ නම : කුඩලුවලකුඹුර ; ඉඩමේ විස්තර : තනාගෙන යනු ලබන පාරක් සහිත කුඹුරු ඉඩමක් ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 14.5 ; හිමිකම් කියන්නෝ : රන්නේ, කහඳමෝදර, ජයසේකර ලියන පට බැඳිගේ කරීනේල්හාමි.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 මැයි මස 3 වැනි දින පූ.භා. 11.00 ට හම්බන්තොට දිසාපති කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962 අප්‍රේල් මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

වි. ච. බ. උනන්තැන්න,
හම්බන්තොට දිස්ත්‍රික්කයේ උප දිසාපති.

1962 මාර්තු මස 27 වැනි දින,
හම්බන්තොට කච්චේරිය.

4-72

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපණතෙන් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

මගේ අංකය: එල්ඒ/එෆ්/7671.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:—

පහත සඳහන් ඉඩම් පිහිටා ඇත්තේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ බටගිර ගිරුවා පත්තුව ආදායම් නිලධාරි කොටසේ, මහගීල්ල නම් ගමේය.

සැලැස්ම විස්තර: අංක 297 දරණ අවසාන ගම් සැලැස්මේ, අතිරේක අංක 3

**කැබලි අංකය : 356.**

ඉඩමේ නම : බැද්දයාගේන නොහොත් මලපලාගේන නොහොත් මහවෙල ; ඉඩමේ විස්තර : අවුරුදු 30ක් වයසැති පොල් ගස් 32ක්, ගඩොලින් තනන ලද බිත්තිවලින් යුත් අතුසෙවිලි කරන ලද පාසල් ගොඩනැගිල්ලක් හා ගඩොලින් තනන ලද වැසිකිළියක් ද ඇති ඉඩමක් ; ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 04.1 ; හිමිකම් කියන්නෝ : බෙලිඅත්තේ, මහගීල්ලේ දොන් සලමන් සමරසේකර වීරසූරිය, ගොඩනැගිලි තනන ලද්දේ මහගීල්ල ග්‍රාම සංවර්ධන සමිතිය මගිනි.

**කැබලි අංකය : 357.**

ඉඩමේ නම : බැද්දයාවත්ත ; ඉඩමේ විස්තර : අවුරුදු 30ක් වයසැති පොල් ගස් 5ක් ඇති ඉඩමක් ; හිමිකම් කියන්නෝ : බෙලිඅත්තේ, මහගීල්ලේ දොන් සලමන් සමරසේකර වීරසූරිය, ගොඩනැගිලි තනන ලද්දේ මහගීල්ල ග්‍රාමසංවර්ධන සමිතිය මගිනි ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 6.8.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 මැයි මස 2 වැනි දින පූ.භා. 10ට බෙලිඅත්ත සුළු නගර සභා කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962 අප්‍රේල් මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

වි. ච. බ. උනන්තැන්න,
හම්බන්තොට දිස්ත්‍රික්කයේ උප දිසාපති.

1962 මාර්තු මස 27 වැනි දින,
හම්බන්තොට කච්චේරිය.

4-69

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපණතෙන් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

යොමු අංකය: එල්ඒ/එෆ්/7684.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:—

පහත සඳහන් ඉඩම පිහිටා ඇත්තේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බටගිර ගිරුවා පත්තුව ආදායම් නිලධාරි කොටසේ ගෝනාදෙනිය නම් ගමේය.

**සැලැස්ම විස්තර: අංක 372 දරණ අවසාන ගම් සැලැස්මේ අංක 1, දරණ අතිරේක සැලැස්ම.**

**කැබැලි අංකය : 364.**

ඉඩමේ නම : වෙදකඩේවත්ත නොහොත් සේරුගහගේන ; ඉඩමේ විස්තරය : අවුරුදු 5 සිට 10 දක්වා වයසැති පොල් ගස් 6කින් යුත් පොල් ඉඩමක් ; හිමිකම් කියන අය : වීරකැටිය, මණ්ඩාඩුවේ ඩී. එච්. ගලගම ; ප්‍රමාණය : අ. 0, රූ. 3, ප. 36.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 මැයි මස 8 වැනි දින පූ.භා. 10ට වලස්මුල්ල ගම්කාර්ය සභා කාර්යාලයේදී (වීරකැටිය) මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962 අප්‍රේල් මස 30 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

වි. ච. බ. උන්නතැන්න,
හම්බන්තොට දිස්ත්‍රික්කයේ උප දිසාපති.

1962 මාර්තු මස 27 වැනි දින,
හම්බන්තොට දිස්ත්‍රික්කය.

4-64.

## 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

සඳහන් අංකය: ඇල්ඒ 1129

මහාජන කාර්යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර:—

යාපනය දිස්ත්‍රික්කයේ උතුරු වලිකාමම් ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ කන්කසන්තුරේ සුළු නගර සභාවේ අංක 3 දරණ කොට්ඨාශයේ ගුරු පාරේ වරිපනම් අංක 96 දරණ අම්පඩිය වට්ටෙයි නැමති ඉඩමේ කොටසක් ද ගුරු පාරේ වරිපනම් අංක 96/1 ද ගුරු පාරේ වරිපනම් අංක 100 ද තෙයිවාපොට්කඩ්ඩු, නාවලියන් සහ පුහුතෝවාන්වයල් නැමැති අ. 0, රූඩ්. 01, පර්. 13.4 ක් පමණ වූද, "සිලුම්පිලතෙයි" නැමැති අංක ඒ 2318 දරණ මූලික සිතියමේ කැබලි අංක. 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10 වශයෙන් මැන වෙන්කරනලද ඉඩම් කැබලි දහය.

මෙම ඉඩම්වලට හිමිකම් කියා සිටින අයගේ නම් සහ ලිපිනයන් —

1. කන්දයියා පෙරම්බලම්, කන්කසන්තුරේ.
2. තේවාදියා පිල්ලෙ සෙල්ලප්පා, මහත්මිය, කන්කසන්තුරේ.
3. තිරුවඩි සන්ගර පිල්ලෙ, කන්කසන්තුරේ.
4. අරුනාසලම් විනසිතම්බි, කන්කසන්තුරේ.
5. විස්වලිංගම් සරවනමුත්තු, කන්කසන්තුරේ.
6. විස්වලිංගම් සෙල්ලයියා, කන්කසන්තුරේ.
7. නාගලිංගම් ගනේෂපිල්ලෙ, කන්කසන්තුරේ.
8. නාගලිංගම් සින්නප්පා, කන්කසන්තුරේ.
9. ඉලංකයාර් කදිරවේළු, කන්කසන්තුරේ.
10. සිවපාක්කියම් පොන්නුසාමි මහත්මිය, කන්කසන්තුරේ.
11. පොන්නම්මා අප්පදුරේ මහත්මිය—උඩයාර්කිනවට්ටයි අලවෙඩි උතුර.
12. වන්නියාසිංහම් තුරේසිංහම්, කන්කසන්තුරේ.
13. විනයාගර් අප්පදුරේ, කන්කසන්තුරේ.
14. සින්නතම්බි රාසයියා, කල්වියාන්කාඩු, යාපනය.
15. නාගලිංගම් සින්නයියා, කන්කසන්තුරේ.
16. සීනියාර් පෙරුම්බලම්, මාවිඩ්ඩිපුරම්.

### උගස්කරුවන් ද ඇතුලුව

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1962 මැයි මස 17 දින පෙරවරු 10.00 ට යාපනය කච්චේරියේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1962 මැයි මස 2 වැනි දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි. මෙම ඉඩමට ඔවුන්ගේ සම්බන්ධතාවයන් ගෙනහැර දැක්වීම සඳහා උගස් ඔප්පු ඇතුළු ඔප්පු සහ අනිකුත් ලියකියවිලිද පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු අතර ඉල්ලා සිටින වන්දි මුදලද එහිදී දන්වා සිටිය යුතුයි.

අසිවන් සමරවික්‍රම,
යාපනය දිස්ත්‍රික්කයේ උප දිසාපති.

යාපනය කච්චේරිය,
1962 ක් වූ මාර්තු මස 29 දා ය.

4-100

---

සඳහන් අංකය 3/64/8

## 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහාජන කාර්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම් ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩම්වල විස්තර:—වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, උතුරු කටුගම්පොල කෝරළේ, කොස්හේන ගමේ, අංක 2,191 දරණ අ. ග. ස. 1 වෙනි අතිරේකය.

**අංකය 199.**

ඉඩමේ නම: කෝන්ගහමුලවත්ත; විස්තරය: ප්‍රසිද්ධ කුඩා පාර (වත්තේ කොටසක්); අයිතිකරු: හේරත් ඉට්හාමිලාගේ ලීලාවතී, කොස්හේන, ඉළුක්හේන; ප්‍රමාණය: අ. 0. රූ. 0. ප. 00.9.

**අංකය: 200.**

ඉඩමේ, නම: නයිවෙලකුඹුර; විස්තරය: ප්‍රසිද්ධ කුඩා පාර (වී වගාකළායයි කියන); අයිතිකරු: සමරදිවයපපතිරෙන් නැහෙලාගේ පොඩිහාමි, සමරදිවයපපතිරෙන් නැහෙලාගේ ජුවානිස්අප්පු සහ ඇස්. ඇම්. මේනුහාමි, කදුරුගස්හේන, කුලියාපිටිය, සමරදිවයපපතිරෙන් නැහෙලාගේ ජූලිහාමි සහ හේරත් ඉට්හාමිලාගේ ලීලාවතී, කොස්හේන, ඉළුක්හේන, සමරදිවයපපතිරෙන් නැහෙලාගේ ඉසබෙලාහාමි, කදුරුවෙල, පොලොන්නරුව; ප්‍රමාණය: අ. 0. රූ. 0. ප. 12.0.

**අංකය: 201.**

ඉඩමේ නම: කොවිලකුඹුර; විස්තරය: ප්‍රසිද්ධ කුඩා පාර, (වී වගාකළායයි කියන); අයිතිකරු: පියදාස බස්නායක, කොස්හේන ඉළුක්හේන; ප්‍රමාණය: අ. 0. රූ. 0. ප. 13.4.

**අංකය: 202**

ඉඩමේ නම: කොවිලකුඹුර; විස්තරය: ප්‍රසිද්ධ කුඩා පාර (වී වගාකළායයි කියන); අයිතිකරු: අප්පුහාමි ආරච්චිලාගේ පොඩිහාමි, අප්පුහාමි ආරච්චිලාගේ පොඩිසිංඤෝ සහ අප්පුහාමි ආරච්චිලාගේ උක්කුබන්ඩා, කොස්හේන, ඉළුක්හේන; ප්‍රමාණය: අ. 0. රූ. 0. ප. 02.3.

**අංකය: 203.**

ඉඩමේ නම: මීගහමුලවත්ත; විස්තරය: අවුරුදු 30 ක් පමණ වයසැති පොල් ගසක් සහිත පොල් ඉඩම; අයිතිකරු: අප්පුහාමි ආරච්චිලාගේ උක්කු බන්ඩා, කොස්හේන, ඉළුක්හේන (බලෙන් අල්වාගත්); ප්‍රමාණය: අ. 0. රූ. 0. ප. 01.9.

**අංකය: 204.**

ඉඩමේ නම: පිටනැකුඹුර; විස්තරය: කුඹුර; අයිතිකරු: හෙට්ටි ආරච්චිගේ මාෂල් පෙරේරා, තබ්බෝව, නාත්තන්ඩිය (බලෙන් අල්වාගත්); ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 04.4.

**අංකය: 205.**

ඉඩමේ නම: පල්ලේකුඹුරවත්ත නොහොත් එගොඩවත්ත; විස්තරය: මුඩු බිම (වගාවක් නැති); අයිතිකරු: බස්නායක අප්පුහාමිලාගේ සෝමාවතී, කොස්හේන, ඉළුක්හේන (බලෙන් අල්වාගත්); ප්‍රමාණය: අ. 0. රූ. 0. ප. 00.2.

**අංකය: 206.**

ඉඩමේ නම: නියරළුපිටිය කුඹුර; විස්තරය: කුඹුර; අයිතිකරු: කුරුප්පුආරච්චිගේ ගුණසේකර සහ කුරුප්පුආරච්චිගේ පුංචිරාල, කොස්හේන, ඉළුක්හේන (බලෙන් අල්වා ගත්); ප්‍රමාණය: අ. 0. රූ. 0. ප. 00.8

**අංකය: 208**

ඉඩමේ නම: පල්ලේකුඹුරවත්ත නොහොත් එගොඩවත්ත; විස්තරය: මුඩු බිම (වගාවක් නැති); අයිතිකරු: බස්නායකඅප්පුහාමිලාගේ සෝමාවතී, කොස්හේන, ඉළුක්හේන, (බලෙන් අල්වාගත්); ප්‍රමාණය: අ. 0. රූ. 0. ප. 01.5.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩම්වලට සම්බන්ධතාවයන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1962 මැයි මස 24 දින පෙ. ව. 11.00 ට කුලියාපිටියේ ප්‍රාදේශීය ආදායම් කාර්‍යාලයේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම් පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම් පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1962 මැයි මස 17 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

ඇම්. ඇල්. ජේ. වික්‍රමරත්න,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

කුරුණෑගල කච්චේරිය,
1962 මාර්තු මස 24 දය.

4-10

යොමු අංකය : ඇල්ඒ. 3654

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1950 අංක 9 දරණ රජයට ඉඩම් අත්කර ගැනීමේ පනතේ 31 වන වගන්තිය යටතේ වූ දැන්වීමයි

පුත්තලම දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති තැන්.පත් කිරිබණ්ඩා දිසානායක වන මම, මෙහි පහත උප ලේඛනයේ විස්තර කර ඇති ඉඩම රජයට අත්කර ගැනීම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදල සහ එම වන්දි මුදලට නියමිත පොළිය වශයෙන් රු. 798/86 මුදලක් රජයට ඉඩම් අත්කර ගැනීමේ පනතේ 31වන වගන්තිය යටතේ හලාවත දිස්ත්‍රික් උසාවියට ගෙවා ඇති බව මෙයින් දන්වමි. එම මුදලට නිසි අයිතිවාසිකම් ඇති අය විසින් උසාවිය වෙත ඉල්ලුම් කර මුදල් ලබාගත යුතුය. මීට සම්බන්ධ හලාවත දිස්ත්‍රික් උසාවියේ නඩු නොම්මරය 322/එස්පීඑල් වේ.

කේ. බී. දිසානායක,
පුත්තලම් දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති.

1962 මාර්තු 30 දින,
පුත්තලම් කච්චේරියේ දීය.

### උප ලේඛනය

හලාවත දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ යටකලන් පත්තුවේ පහල කොස්වාඩිය ගමේ පිහිටි, ඒ 1608 දරණ මූලික සැලැස්මේ අංක 8 සහ 9 වශයෙන් විස්තර කර ඇති ප්‍රමාණය පිළිවෙලින් පර්චස් 6.1 සහ පර්චස් 4 ක්වූ, ආගරවත්ත නොහොත් කහටගහවත්ත ගල්ඹිට සහ ආගරවත්ත නොහොත් මකුලුගහවත්ත නමැති ඉඩම් කැබලි දෙක.

4-190

---

## ඉඩම් සංවර්ධන ආඥපනත යටතේ දැන්වීම

### ඉඩම් ප්‍රදාන පත්‍ර (ග්‍රාන්ට) දීමට යෝග්‍ය අය තෝරා ගැනීම සඳහා පවත්වන ඉඩම් කච්චේරි

පහත විස්තර කෙරෙන රජයේ ඉඩම් සඳහා ප්‍රදාන පත්‍ර දීමට යෝග්‍ය අය තෝරා ගැනීම සඳහා 1962 මැයි මස 11 වන සිකුරාද පෙරවරු 10.30ට කිලිනොච්චියේ, ගනේෂ්පුරම්හි ප්‍රජාමණ්ඩල ශාලාවේදී ඉඩම් සංවර්ධන ආඥපනත (320 වන) සටතේ යාපනය දිසාපති තැන විසින් ඉඩම් කච්චේරියක් පවත්වනවා ඇත.

2. සෑම අයදුම්කරුවෙක්ම තමාම හෝ තමාගේ බලයලත් නියෝජිතයෙක් හෝ මෙම ඉඩම් කච්චේරියට සහභාගි විය යුතුය.

3. මේ සම්බන්ධ වැඩි විස්තර යාපනයේ දිසාපතිගෙන් ලබා ගත හැකිය.

ඩබ්ලිව්. එච්. ජයසිංහ,
ඉඩම් අධිකාරි තැන වෙනුවට

1962 ක්වූ පෙබරවාරි මස 24 වෙනිද,
කොළඹදීය.

ප්‍රධාන පත්‍ර දෙනු ලබන ඉඩම්

කිලිනොච්චියේ පිහිටි 10 වන වාරිමාර්ග මැනුමේ මූලික සැලැස්ම

| අනු ක්‍රමික අංකය | ඉඩම් කට්ටිය | බලපත්‍රකරුගේ නම | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|
| 1. | 47 (ගොඩ ඉඩම) | වන්ගඩසලාම්පිල්ලෙ රාමසාමි | 1 3 38 |
| | 34 (මඩ ඉඩම) | ... | 4 3 29 |
| 2. | 51 (ගොඩ ඉඩම) | ගෝවින්දන් ඒරම්බමූර්ති | 2 0 03 |
| | 125 (මඩ ඉඩම) | ... | 5 0 08 |
| 3. | 53 (ගොඩ ඉඩම) | ෂන්මුගම්පිල්ලෙ කුලන්දයිවේලු | 1 3 29 |
| | 21 (මඩ ඉඩම) | ... | 5 0 21 |
| 4. | 55 (ගොඩ) | චාර්ලස් ඇන්ටනි පෙටර්සන් | 2 0 01 |
| | 20 (මඩ) | ... | 5 0 17 |
| 5. | 56 (ගොඩ | රාමසි දේවසගායම් | 1 3 32 |
| | 15 (මඩ) | ... | 4 3 21 |
| 6. | 59 (ගොඩ) | තේවමනි කන්දයියා | 2 1 06 |
| | 11 (මඩ) | ... | 4 2 39 |
| 7. | 62 (ගොඩ) | නාගනාදර් කන්දයියා | 1 3 35 |
| | 2 (මඩ) | ... | 5 0 29 |
| 8. | 64 (ගොඩ) | සින්නාර් සුප්පයියා | 1 3 35 |
| | 3 (මඩ) | ... | 4 3 01 |
| 9. | 66 (ගොඩ) | ඥානමනි සෙල්වරත්නම් | 2 0 02 |
| 10. | 67 (ගොඩ) | තන්ගම්මා චිනිසිතම්බි | 2 0 07 |
| | 6 (මඩ) | ... | 4 2 18 |
| 11. | 75 (ගොඩ) | කනපතිපිල්ලෙ තම්බයියා | 1 3 18 |
| | 7 (මඩ) | ... | 4 2 29 |
| 12. | 76 (ගොඩ) | පලනි කුප්පන් සින්නයියා | 1 2 32 |
| | 23 (මඩ) | ... | 4 2 25 |
| 13. | 77 (ගොඩ) | තයිවනිපිල්ලෙ සුන්දරම්පිල්ලේ | 1 3 22 |
| | 71 (මඩ) | ... | 4 3 10 |
| 14. | 78 (ගොඩ) | ආරුමුගම් කදිරවේලු | 2 1 11 |
| | 72 (මඩ) | ... | 5 0 34 |
| 15. | 79 (ගොඩ) | මරිමුත්තු සෙල්ලතුරේ | 1 3 35 |
| | 73 (මඩ) | ... | 7 1 01 |
| 16. | 81 (ගොඩ) | වළුන්න සිල්වෙස්ටර් | 2 3 03 |
| | 70 (මඩ) | ... | 5 0 09 |
| 17. | 82 (ගොඩ) | මුරුගන් කන්දන් | 2 0 00 |
| | 69 (මඩ) | ... | 4 2 33 |
| 18. | 83 (ගොඩ) | තලයමුත්තු සුප්පයියා | 1 3 38 |
| | 8 (මඩ) | ... | 4 3 02 |
| 19. | 84 (ගොඩ) | ඉලයතම්බි කන්දයියා | 2 1 05 |
| | 16 (මඩ) | ... | 4 3 37 |
| 20. | 85 (ගොඩ) | සරවනමුත්තු වල්ලිපුරම් | 1 3 34 |
| | 17 (මඩ) | ... | 5 1 06 |
| 21. | 86 (ගොඩ) | කනපතිපිල්ලෙ සෙල්ලයියා | 1 3 33 |
| | 19 (මඩ) | ... | 4 3 23 |
| 22. | 87 (ගොඩ) | මනුවෙල් පාවිලු අම්ර්තනාදර් | 1 3 29 |
| | 18 (මඩ) | ... | 4 3 24 |
| 23. | 91 (ගොඩ) | මරිමුත්තු සභාපති | 2 2 15 |
| | 30 (මඩ) | ... | 4 3 26 |
| 24. | 92 (ගොඩ) | මුතුකුමාරි අප්පදුරෙයි | 2 2 34 |
| | 29 (මඩ) | ... | 4 3 06 |
| 25. | 93 (ගොඩ) | පිලයිනාරි තම්බයියා | 2 0 07 |
| | 28 (මඩ) | ... | 4 3 20 |
| 26. | 94 (ගොඩ) | ඥාණප්‍රගාසම් සෙල්ලයියා | 2 0 01 |
| | 27 (මඩ) | ... | 5 2 24 |
| 27. | 95 (ගොඩ) | කන්නයියා නල්ලයියා | 2 0 06 |
| | 26 (මඩ) | ... | 4 2 15 |
| 28. | 96 (ගොඩ) | නාගන් මුරුගන් | 2 0 0 |
| | 25 (මඩ) | ... | 4 3 34 |
| 29. | 97 (ගොඩ) | කන්නන් මානික්කන් | 1 2 23 |
| | 145 (ගොඩ) | ... | 0 1 15 |
| | 103 (මඩ) | ... | 4 3 27 |
| 30. | 116 (ගොඩ) | අම්ර්තනාදන් එඩ්වඩ් | 1 3 17 |
| | 106 සහ 41 (මඩ) | ... | 5 1 09 සහ 0 0 11 |
| 31. | 117 (ගොඩ) | කනපතිපිල්ලේ කදිරවේළු | 2 0 08 |
| | 107 (මඩ) | ... | 6 0 22 |
| 32. | 118 (ගොඩ) | තන්ගම්මා තිලයප්පලම් | 2 0 37 |
| | 113 (මඩ) | ... | 7 3 19 |
| 33. | 119 (ගොඩ) | කන්දයියා කුළසේකරම් | 2 1 30 |
| | 114 (මඩ) | ... | 6 0 0 |
| 34. | 131 (ගොඩ) | වල්ලිඅම්මා පාරමු | 2 1 07 |
| | 128 (මඩ) | ... | 4 3 19 |
| 35. | 138 (ගොඩ) | එලයතම්බි කලිදසන් | 1 3 38 |
| | 126 (මඩ) | ... | 4 3 38 |
| 36. | 139 (ගොඩ) | කනදර් කනපතිපිල්ලෙ | 1 3 35 |
| | 109 (මඩ) | ... | 6 0 05 |
| 37. | 140 (ගොඩ) | අරියකුඩ්ඩි වයිතිලින්ගම් | 2 0 09 |
| | 101 (මඩ) | ... | 4 3 17 |
| 38. | 141 (ගොඩ) | කනගර් කන්දයියා | 2 0 04 |
| | 105 සහ 42 (මඩ) | ... | 6 1 21 සහ 0 0 18 |
| 39. | 143 (ගොඩ) | සින්නයියා අරුනාෂලම් | 2 0 02 |
| | 36 (මඩ) | ... | 4 3 07 |
| 40. | 146 (ගොඩ) | සරවනමුත්තු සෙල්ලප්පා | 2 0 04 |
| | 32 (මඩ) | ... | 5 3 30 |
| 41. | 148 (ගොඩ) | සෙල්ලාච්චි මුතුතම්බි | 2 0 10 |
| | 37 (මඩ) | ... | 4 3 10 |
| 42. | 150 (ගොඩ) | ජෝෂප් ආශිර්වාදම් | 2 0 02 |
| | 38 (මඩ) | ... | 4 3 30 |
| 43. | 151 (ගොඩ) | මයිකල් ඇන්තනිපිල්ලෙ | 2 0 0 |
| | 39 (මඩ) | ... | 4 3 31 |
| 44. | 154 (ගොඩ) | සින්නයියා කන්දයියා | 2 0 14 |
| | 111 (මඩ) | ... | 3 2 33 |
| 45. | 5 (මඩ) | කන්දන් වඩිවේළුසාමි | 4 3 13 |

4—50

## ඉඩම් ප්‍රධාන පත්‍ර (ග්‍රාන්ට්) දීමට යෝග්‍ය අය තෝරා ගැනීම සඳහා පවත්වන ඉඩම් කච්චේරිය

පහත විස්තර කෙරෙන රජයේ ඉඩම් සඳහා ප්‍රධාන පත්‍ර දීමට යෝග්‍ය අය තෝරා ගැනීම සඳහා 1962 මැයි 10 වන බ්‍රහස්පතින්ද පෙරවරු 10ට යාපනය කච්චේරියේ දී 1935 හේ 19 වන ඉඩම් ආඥාපනත යටතේ යාපනය දිසාපති තැන විසින් ඉඩම් කච්චේරියක් පවත්වනවා ඇත.

2. අයදුම්කරුවන් හැම කෙනෙක් ම තමාම හෝ තමාගෙන් බලය ලත් නියෝජිතයෙක් හෝ මෙම ඉඩම් කච්චේරියට සහභාගි විය යුතුය.

3. මේ සම්බන්ධ සියලුම වැඩි විස්තර යාපනය දිසාපති තැනගෙන් ලබාගත හැකිය.

ඩබ්ලිව්. එච්. ජයසිංහ,
ඉඩම් කොමසාරිස් වෙනුවට,

1962 මාර්තු මස 9 වැනි දින,
කොළඹ දී ය.

ප්‍රදාන පත්‍ර දෙනු ලබන ඉඩම්

### කිලිනොච්චියේ පිහිටි 34 වන නගර මැනුමේ මූලික සැලැස්ම

| අනු ක්‍රමික අංකය | කොටස | බලපත්‍ර කරුගේ නම සහ ලිපිනය | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|
| 1 ... | 15 ... | ඇස්. ඩබ්ලිව්. ජී. රත්නසාර්, කොළඹ... | 1 3 38 |
| 2 ... | 40 ... | ඇස්. සී. නලල්ශියා, කිලිනොච්චිය ... | 0 0 38 |
| 3 ... | 100 ... | සින්නපිල්ලෙ වේලුපිල්ලෙ, කිලිනොච්චිය ... ... | 0 2 13 |
| 4 ... | 122 ... | පාරුවතී කන්දන්, කිලිනොච්චිය ... | 0 2 18 |
| 5 ... | 124 ... | ඇන්. කනපති පිල්ලෙ නොහොත් ඒ. රත්නන්, කිලිනොච්චිය ... | 0 2 14 |
| 6 ... | 130 ... | ඒ. ඇන්. කන්දයියා ... | 0 0 38 |
| | සහ 131 ... | ඒ. ඇන්. කන්දයියා ... | 0 0 38 |
| 7 ... | 142 ... | සින්නම්මා මුරුගන්, කිලිනොච්චිය ... | 0 2 18 |
| 8 ... | 158 ... | පොන්නම්මා නොහොත් තන්ගම්මා වේලුපිල්ලෙ, කිලිනොච්චිය ... | 0 2 01 |
| 9 ... | 161 ... | පණ්ඩිත ඒ. කනගරත්නම්, බම්බලපිටිය | 0 3 17 |

4—49/1

## ඉඩම් ප්‍රධාන පත්‍ර (ග්‍රාන්ට්) දීමට යෝග්‍ය අය තෝරාගැනීම සඳහා පවත්වන ඉඩම් කච්චේරිය

පහත විස්තර කෙරෙන රජයේ ඉඩම් සඳහා ප්‍රධාන පත්‍ර දීමට යෝග්‍ය අය තෝරා ගැනීම සඳහා 1962කේ මැයි 10 වන බ්‍රහස්පතින්ද පෙරවරු 10ට යාපනය කච්චේරියේ දී 1935හේ 19 වන ඉඩම් සංවර්ධන ආඥාපණත යටතේ යාපනය දිසාපති තැන විසින් ඉඩම් කච්චේරියක් පවත්වනවා ඇත.

2. අයදුම්කරුවන් හැම දෙනෙක් ම තමාම හෝ තමාගෙන් බලයලත් නියෝජිතයෙක් හෝ මෙම ඉඩම් කච්චේරියට සහභාගි විය යුතුය.

3. මේ සම්බන්ධ සියලුම වැඩි විස්තර යාපනය දිසාපති තැනගෙන් ලබාගත හැකිය.

ඩබ්ලිව්. එච්. ජයසිංහ,
ඉඩම් කොමසාරිස් වෙනුවට

1962 මාර්තු මස 9 වැනි දින,
කොළඹ දී ය.

ප්‍රධාන පත්‍ර දෙනු ලබන ඉඩම්

### කිලිනොච්චියේ පිහිටි 3 වන වාරිමාර්ග මූලික සැලැස්මේ (පෙරියප්‍රනාදන්)

| | කට්ටිය | බලපත්‍රකරුගේ නම | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|
| 1. | 205 ... | ඇස්. රාජරත්නම්, කොකුවිල් ... | 5 2 15 |
| 2. | 206 ... | ඇස්. රත්නසභාපති, ඩී–7 කිලිනොච්චි ... | 10 0 0 |
| 3. | 223 ... | මනෝමනී රත්නසභාපති ... | 17 2 36 |
| 4. | 227 ... | වී. මුතුකුමාරු, කිලිනොච්චි ... | 9 1 04 |
| 5. | 231 ... | ඇම්. නවරත්නම්, කිලිනොච්චි ... | 4 0 10 |
| 6. | 232 ... | ආර්. නාගම්මා, කිලිනොච්චි ... | 2 2 07 |
| 7. | 234 ... | ඇම්. සින්නම්මා, පරවි පංචන්, කිලිනොච්චි | 4 0 16 |
| 8. | 235 ... | කේ. සොරනම්මා, කිලිනොච්චි ... | 2 2 27 |
| 9. | 236 ... | කේ. සින්නයියා, ඩී–7 කිලිනොච්චි ... | 12 0 25 |
| 10. | 240 ... | ඇස්. කනගරත්නම්, වාවාකච්චේරි ... | 18 0 18 |
| 11. | දෙවන අතිරේකයේ 4 වන ඉඩම් කට්ටිය ... | නාගරත්නම් මහත්මිය, යාපනය ... | 14 1 03 |

4—49/2

## දැන්වීමයි

මහනුවර දිස්ත්‍රික්කයේ වෙසෙන කර්මාන්ත ශිල්පීන් පදිංචිකරවීම සඳහා ග්‍රාමීය කර්මාන්ත ජනපදයක් පිහිටුවීමට මහනුවර දිස්ත්‍රික්කයේ පාත දුම්බර ආදායම් පාලක නිලධාරී තැනගේ කොට්ඨාශයට අයත් නත්තරන්පොත නැමැති ගමින් අක්කර 22 ක් රජය විසින් අත්කර ගනු ලැබේ. මෙම ඉඩම පර්චස් 25 හේ බිම් කැබලි 75 කට බෙදනු ඇත. ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ තෝරාගනු ලබන කර්මාන්ත ශිල්පීන්ට මෙම බිම් කැබලි පවරා දෙන අතර, ඒ සඳහා වාර්ෂික ගෙවීමක් ඔවුන් විසින් කළ යුතු වේ. මෙම ගෙවීම එක් ලැබුම් කරුවකුගෙන් අවුරුද්දකට රුපියල් 24 ක් පමණ වේයැයි ගණන් බලා ඇත. එක් එක් බිම් කොටසෙහි කාමර දෙකක්, මුළුතැන්ගෙය, බරාඳය, වැඩපොළක් සඳහා ඉඩ කඩ සහ වැසිකිළියකින්ද යුක්තවූ ස්ථිර පියසක් සහිත ගෙයක් බැගින් රජය විසින් ගොඩ නගනු ඇත. පොදු වශයෙන් ජල පහසුකම් ද සළස්වනු ලැබේ. ඉඩම් ලැබුම් කරුවන් ජනපදයට කැඳවන්නට පෙර මෙම නිවාස සාදා නිමකරනු ඇත. නිවාස සඳහා සාධාරණ කුලියක් අය කරනු ලැබේ.

යෝජිත කර්මාන්ත ජනපදය පිහිටා ඇත්තේ මහනුවර නගරයෙන් සැතපුම් 5 ක් ඈතින්, මහනුවර-තෙල්දෙනිය මහා මාර්ගය සමීපයෙහිය. පාසල්, පූජනීය ස්ථාන සහ සමුපකාර වෙළඳ සැලක් යාබද ප්‍රදේශයෙහි ඇත. ගමන් පහසුකම්, ක්‍රීඩා භූමියක්, ප්‍රජා ශාලාවක් ආදී තවත් පහසුකම් ද, කර්මාන්ත ශිල්පීනට පොදු නිෂ්පාදන පහසුකම් ලබා ගනු සඳහා මධ්‍යම කම්හලක් ද රජය විසින් සලසා දෙනු ඇත. කර්මාන්ත ජනපදයේ පදිංචි වෙන සියලුම ශිල්පීන් මෙම ක්‍රමය යටතේ සංවිධානය කරනු ලබන කර්මාන්ත ශිල්පීන්ගේ සමුපකාර සමිතියකට බැඳීම අවශ්‍යය. අමු ද්‍රව්‍ය සැපයීම, ණය පහසුකම් සහ භාණ්ඩ අලෙවි කිරීම සම්බන්ධයෙන් කර්මාන්ත ශිල්පීනට අවශ්‍ය උපකාර රජය විසින් සලස්වා දෙනු ලබන්නේ මෙම කර්මාන්ත ශිල්පීන්ගේ සමුපකාර සමිතිය මාර්ගයෙනි.

මෙම යෝජනා ක්‍රමය යටතේ ඉඩම් ලබන්නට කැමැති දැනට මහනුවර දිස්ත්‍රික්කයේ වෙසෙන කර්මාන්ත ශිල්පීන් විසින් තම නම, ලිපිනය ලැබෙන පිළිවෙල, නිරතවූ කර්මාන්තය ආදී විස්තර සඳහන් කොට ප්‍රදේශයේ ආදායම් පාලක නිලධාරී තැන වෙත 1962.4.30 දිනට පෙර ලියා ඉල්ලුම්කළ යුතු ය. මෙම යෝජිත ජනපදයේ පදිංචිකරවීම සඳහා සුදුස්සන් තෝරාගැනීමේදී ඉඩ-කඩම් නැති කර්මාන්ත ශිල්පීන් ගැන විශේෂයෙන් සළකා බලනු ඇත.

සී. ජේ. සේරසිංහ,
මහනුවර දිසාපති.

1962.3.31 දින,
මහනුවර ලේකම් කාර්යාලයේ දීය.

4-144

## දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි

මෙහි පහත විස්තර දක්වෙන ආණ්ඩුවේ ඉඩම් සඳහා දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගනු පිණිස රත්නපුර කච්චේරියේදී 1962 මැයි මස 4 වෙනි දින පූ. භා. 10 ට 1935හේ අංක 19 දරන ඉඩම් සශ්‍රීක කිරීමේ ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් රත්නපුර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. ඉඩම් කට්ටි ලබාගනු කැමති සැම අයකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනී සිටීමට නියෝජිතයකු එවිය යුතුයි.

3. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

ඩබ්ලිව්. එච්. ජයසිංහ,
ඉඩම් කොමසාරිස්තැන වෙනුවට.

දීමට යන ඉඩමේ විස්තර

ප්ලෑනේ අංකය හා ගම: අ.ග.සි. 365ඒ, බඩහැල්ගොඩ; කැබෙල්ලේ අංකය: 87; අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම: ඇස්. ජී. සමරසිංහ මහතා; ප්‍රමාණය: අ. 5, රූ. 3. ප. 35.

4-137

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

## මාතර දිස්ත්‍රික්කය-දැරංගල ගොඩ බිම්ගොවිජනපද යෝජනා ක්‍රමයේ (III) පියවර වෙළෙඳ කටයුතු සඳහා රජයේ ඉඩම් බදු විකිණීම යි

මාතර දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති (මින් පසු දිසාපති යනුවෙන් හඳුන්වනු ලබන්නේ මෙම විකිණීම උදෙසා නිසි පරිදි එතුමාගෙන් බලය ලත් නිළධාරියෙකි) 1962 මැයි මස 15 වෙනි දින පෙරවරු 10.00 ට පහත සඳහන් උප ලේඛණයේ විස්තර දැක්වෙන, වෙළෙඳ කටයුතු සඳහා වෙන්වුනු, මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරලයේ ප්‍රාදේශීය ආදායම් නිළධාරි කොටසේ, දැරංගල ගොඩ බිම් ගොවිජන පදයයේ III වෙනි පියවරේ පිහිටි රජයේ ඉඩම් කට්ටිවල බද්ද දැරංගල ගොවි ජනපද පාසැලේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. ප්‍රථමයෙන් ම, ඉල්ලුම් කිරීම විවෘත වනුයේ මෙම විකිණීම කරන අවස්ථාව වන විට මාතර දිස්ත්‍රික්කයේ අවුරුදු 5 කට නො අඩු කාලයක් අඛණ්ඩව පදිංචියක් ඇති අයට පමණි. ඉල්ලීම් කිරීමට බලාපොරොත්තු වන අය අවශ්‍ය වෙතොත් මෙම ඡේදයේ දැක් වෙන පරිදි ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගෙන් පදිංචිය පිළිබඳ සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. යම් අයෙකුට මෙම සුදුසුකම් තිබීම හෝ නො තිබීම ගැන යම් ආරාවුලක් ඇතිවන අවස්ථාවක් වුවහොත්, දිසාපති තුමාගෙන් ලැබෙන තීරණය අවසාන තීරණය වන්නේ ය. එවැනි අය අතර ඉල්ලුම්කරුවන් නො වුවහොත් පොදු ජනයාට ඉල්ලීමට ඉඩ දෙනු ලැබේ.

3. විකිණීම කරන දිනයේ සිට ඊට පෙරින් දෙසතියක් ඇතුළත දී කවර අවස්ථාවක දී හෝ මෙහි ඇති උප ලේඛනයේ විස්තර වන කැබැල්ලක භුක්තිය අනවසරයෙන් ලබා සිටි කෙනෙකුට විකිණීමේ දී ඉල්ලුම් කළ නො හැක. කෙනෙකු අනවසරයෙන් භුක්ති ලබා සිටි නො සිටි බව ගැන දිසාපති විසින් කරනු ලබන තීරණය අවසාන තීරණය වන්නේ ය.

4. කිසිම කෙනෙකුට එක බිම් කැබැල්ලකට වඩා බදු ගැනීමට අවසර නොලැබේ.

5. ඉල්ලුම් කිරීම ඇරඹෙනුයේ ලන්සුවකිනි. එක කැබැල්ලක අඩුම ලන්සුව රුපියල් 25 කි. මෙම ලන්සුවට අඩුවෙන් කැරෙන කිසිම ඉල්ලීමක් පිළිගනු නො ලැබේ.

6. කිසියම් ඉල්ලීමක් පිළිගන්නට පෙරින් බද්දේ කොන්දේසි පිළිපැදීමට ඔහුට ඇති හැකියාව සහ ඔහුගේ නිර්ව්‍යාජත්වය ගැන දිසාපති සැහීමකට පත්විය යුතුයි. දිසාපති සෑහීමකට පත් නොවන්නේ නම් එවැනි ඉල්ලීම්, ඉල්ලීමක් නො කළා සේ සළකා වෙන්දේසිය පවත්වාගෙන යනවා ඇත.

7. සෑම ඉල්ලුම් කරුවෙකුම පුද්ගලිකව ම හෝ නිසිවූ පරිදි බලය ලත් නියෝජිතයකු මඟින් සඳහන් කළ ස්ථානයේ දී, නියමිත වේලාවට පෙනී සිටිය යුතුයි. එසේ බලය ලත් නියෝජිතයා විසින් විකිණීම කිරීමට පෙරින් ඔහුට එසේ පෙනී සිටීමට බලය දුන් බැව්පෙන්වන බලපත්‍රය පරීක්ෂා කිරීම වස් ඉදිරිපත් කළ යුතු වේ.

8. ජයග්‍රාහක සෑම ඉල්ලුම් කරුවකුම :—

(අ) සිය ඉල්ලීම භාරගත් වහාම ඉල්ලුම් කළ මුදල සහ අත්තිකාරම් වශයෙන් පළමු වසරේ බදු මුදලක් දිසාපතිට ගෙවීම,

(ආ) ඔහුට බද්ද භාර දී දින 14 ක් ඇතුළත දී ඊට අදාල බදු ඔප්පු වක් ලියා පදිංචි කිරීම සහ

(ඇ) ඉඩමේ භුක්තිය තමාට භාර දී තෙමසක් ඇතුළත දී ඉඩමේ ව්‍යාපාරයය ආරම්භ කළ යුතුයි.

ඉහත සඳහන් (අ), (ආ) සහ (ඇ) යන ඡේදයන් අනුකූලව පිළිපැදීමට අතපසු කළහොත් බද්ද අවලංගු කර ඉල්ලුම්කරු විසින් ගෙවන ලද සියළු මුදල් ද රාජසන්තක කරනවා ඇත.

9. අනෙක් කොන්දේසි අතර පහත සඳහන් කොන්දේසි ද සෑම බද්දකට ම ඇතුළත් වෙනවා ඇත :—

(අ) කාලය අවුරුදු 30 සි.

(ආ) එක් කැබැල්ලක කුලිය මෙහි ඇති උපලේඛණයේ සඳහන් එම කැබැල්ලට නියමිත කුලිය වේ.

(ඇ) බදු කරුවන් විසින් බද්ද පටන්ගෙන අවුරුද්දක් ඇතුළතදී, දිසාපති විසින් කලින් පිළිගත් සැලැසුම අනුව බද්දෙන් අදහස් කරන ක්‍රමයට ප්‍රයෝජනයට ඇවැසි පරිදි ගොඩනැගිලි තනා අවසන් කිරීම හෝ 8 වෙනි ඡේදයේ (ඇ) අනුඡේදය අනුව, මේ ඡේදයේ සඳහන් කාල සීමාව තුළ ස්ථිර ගොඩනැගිලි සාදන තෙක් විකිණීම අවසන් වූ වහාම තාවකාලික හෝ අර්ධ ස්ථිර ගොඩනැගිලි තැනිය යුතුයි.

(ඈ) සෑම බදුකරුවකුම ඉඩම උප ලේඛනයේ එම කැබැල්ල වෙන් කළ කරුණකින් උදෙසා මිස දිසාපතිගෙන් ලියවිල්ලකින් කලින් ලබාගත් අනුමතිය නො මැතිව අන් කිසි දෙය කට නො යෙදිය යුතුයි.

(ඉ) බදුකරුවන් විසින් මෙම ඉඩම නව අයකුට බදුදීම, පැවරීම, තෑගිදීම, භාරදීම, උකස් කිරීම, හෝ තමා සතු අයිතිවාසිකම් කිසි ලෙසකින් නව කෙනෙකුට පැවරීම හෝ බදු දෙන්නා වෙනුවෙන් ඉඩම් කොමසාරිස් තුමාගෙන් ලියවිල්ලකින් ලත් බලයක් නො මැතිව නො කළ යුතුයි.

(ඊ) බදු කරුවා විසින් ඉඩමට සහ එහි ගොඩනැගිලිවලට ගෙවිය යුතු වරිපනම් සහ අනෙක් සියළුම බදු කාසි ද ගෙවිය යුතුයි.

(උ) බද්ද අවසන් වීමෙන් හෝ බද්ද අවසන් කිරීමෙන් පසුව බදුකරුවා විසින් ඉඩමේ භුක්තිය හා ඉඩමේ ඇති ගොඩනැගිලි සහ අනෙකුත් දියුණු කිරීම් ද, හොඳ තත්ත්වයෙන් දිසාපති තුමාට හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයෙකුට හෝ භාර දිය යුතුයි.

(ගොඩනැගිලි පාවිච්චි කිරීමෙන් නිතැතින් සිදුවන අලාභ හානි ගැන සාධාරණව සළකා බලනු ඇත)

(ඌ) ඉඩමේ තිබෙන්නට හැර ඇති ගොඩනැගිලිවලට හෝ වෙන යම් දෙයකට හෝ කුමන අන්දමේ හෝ වන්දි මුදලක් රජය විසින් නොගෙවනවා ඇත.

10. ඉඩම් කැබැලි පෙන්වා දීම කලින් පිළියෙල කර ගත් පරිදි දැරංගල ජනපදයේ III පියවරේ ජනපද නිළධාරි විසින් කරනු ඇත. මේ සඳහා වැඩි විස්තර ඇවැසි නම් මාතර දිසාපති ගෙන් විමසන්න. කැබැලි වෙන්කර පෙන්වීමේ සිතියම බලා ගැනීම සඳහා ඔහු භාරයේ ඇත.

ප්‍රා. සී. පීටර්ස්,
මාතර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1962 මාර්තු මස 26 වෙනි දින,
මාතර දිසාපති කාර්යාලයේ දී ය.

වෙළෙඳ පෙදෙස් ලේඛණය

| පිහිටීම | ලොට් අංකය | අ. රූ. ප. | බද්දේ පරමාර්ථය | බදු මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|
| මාතර දිස්ත්‍රික්කයේ | 1 | 0 0 23·2 | ආයුර්වේද බෙහෙත් හළක් | 18 | 0 |
| මොරවක් කෝර | 2 | 0 0 24·0 | රෙදිපිළි වෙළඳ හළක් | 18 | 0 |
| ලේ ගොඩ ගොවි | 3 | 0 0 23·2 | එම | 18 | 0 |
| ජනපද ව්‍යාපාරය | 4 | 0 0 24·8 | එම | 18 | 0 |
| යේ, 111 පියවර | 5 | 0 0 32·8 | සාමාන්‍ය වෙළෙඳ කටයුතු | 18 | 0 |
| | 6 | 0 0 32·8 | සාප්පුබඩු වෙළෙඳ හළ | 18 | 0 |
| | 7 | 0 0 21·6 | සාමාන්‍ය වෙළෙඳ කටයුතු (දිසාපති විසින් අනුමත කරනු ලැබූ) | 18 | 0 |
| | 8 | 0 0 23·2 | රෙදි පිරිසිදු කිරීමෙ හළ (ලොන්ඩරි) | 18 | 0 |
| | 9 | 0 0 20·0 | කරණවෑම් හළ (බාබර් සැලූන්) | 18 | 0 |
| | 10 | 0 0 20·8 | තේ පැන් ශාලාව | 18 | 0 |
| | 11 | 0 0 18·4 | තේ පැන් ශාලාව | 18 | 0 |
| | 12 | 0 0 33·6 | කම්මල | 18 | 0 |
| | 13 | 0 0 20·0 | බේකරිය | 18 | 0 |
| | 14 | 0 0 19·7 | පුවත්පත් කළමනාකරු සහ ලිපි ද්‍රව්‍ය | 18 | 0 |
| | 15 | 0 0 29·6 | වඩු කර්මාන්ත ශාලාව | 18 | 0 |
| | 16 | 0 0 27·2 | තේ පැන් ශාලාව | 18 | 0 |
| | 17 | 0 0 25·6 | මස් වෙළෙඳ හළ | 18 | 0 |
| | 18 | 0 0 28·8 | එළවළු වෙළෙඳ හළ | 18 | 0 |
| | 19 | 0 0 24·8 | එම | 21 | 0 |
| | 20 | 0 0 30·4 | බයිසිකල් අළුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානය | 21 | 0 |
| | 21 | 0 0 28·0 | පින්තූර රාමු කිරීමෙ වෙළෙඳ හළ | 21 | 0 |
| | 22 | 0 0 22·4 | තේ පැන් ශාලාව | 21 | 0 |
| | 23 | 0 0 00·8 | එළවළු වෙළෙඳ හළ | 18 | 0 |
| | 24 | 0 1 03·2 | සාප්පු බඩු වෙළෙඳ හළ | 18 | 0 |
| | 25 | 0 1 00·0 | තේ කඩය | 18 | 0 |
| | 26 | 0 0 33·6 | කරණවෑම් හළ (බාබර් සැලූන්) | 18 | 0 |
| | 27 | 0 1 00·0 | දිසාපති විසින් අනුමත කැරුණ සාමාන්‍ය වෙළෙඳ කටයුතු | 18 | 0 |
| | 28 | 0 1 00·8 | දිසාපති විසින් අනුමත කැරුණ සාමාන්‍ය වෙළෙඳ කටයුතු | 18 | 0 |

## විශේෂ නිවේදනයයි

1962 අප්‍රේල් 14 වෙනි සෙනසුරාද සහ 20 වෙනි සිකුරාද ආණ්ඩුවේ නිවාඩු දිනයන් වන බැවින්, 1962 අප්‍රේල් 19 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1962 අප්‍රේල් 13 වැනි සිකුරාද පස්වරු 3.30ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1962 අප්‍රේල් 6 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණු ලබන ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)**

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

**2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපෑලෙන් **එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.**

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද, සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

**5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපෑලෙන් **දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.**

6. ප්‍රමාදය සහ දොස් වලක්වා ගැනීම සඳහා පළ කරන්ට නියමිත "පිටපත" **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

**7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ **නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.**

9. **උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.**

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරණ ගාස්තු මෙසේයි :—

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 5 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 120 0 |

**අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.**

11. **සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින **අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන** දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරණ දින සිට කාර්යාලය වැඩ කරණ දින හතරකට ප්‍රථම **පස්වරු 3.30 ට** සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් **කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති** තැනට **ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පසවරු 3.30ට ප්‍රථමයෙන්).**

13. දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. ශ. | | පිටරට රු. ශ. |
|---|---|---|---|
| එක්කොටසක් ... ... ... | 22 50 | ... | 35 50 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 12 50 | ... | 18 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 20 0 | ... | 28 0 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|---|
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී එක කොටසක් ... ... ... | 0 25 | ... | 0 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක කොටසක් ... ... ... | 0 50 | ... | 0 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 10 | ... | 0 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 20 | ... | 0 15 |

**දායක මුදල් භාරගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.**

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවූන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි